<u>**මොනරාගල ප්‍රාදේශීය සභාව**</u>

<u>**2022.04.08 දින මහ සභා වාර්තාව**</u>

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිල කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ හතලිස් නව වන (49) සභා වාරය 2022.04.08 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

<u>**පැමිණීම**</u>

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයජීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂනායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| | | |
| සභා ලේකම්තුමා | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

<u>**නොපැමිණීම**</u> **-** නැත

<u>**පිළිගැනීම**</u>

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**01.** <u>**පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.**</u>

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහිදී සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පසු ගිය මස මහ සභා වාර්තාව ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ සහ සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාවේ ඒකමතික එකඟතාවයෙන් සභා සම්මත කරන ලදි.

## 02 <u>සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**<u>නැත</u>**

## 03 <u>සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.</u>

නැත

## 04 <u>යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම</u>

**නැත**

## 05. <u>යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 05.1 <u>ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

### යෝජනා අංක 01

මොණරාගල රත්තනපිටිය සිහිනි පෙර පාසල ඌව පළාත් මුල් ළමා විය අධිකාරියේ ලියාපදිංචි දැනට වසර තිහක් පමණ පැරණි පෙර පාසලක් වන අතර මෙහි දරුවන් 25ක් පමණ අධ්‍යාපනය හදාරන බැවින් මෙහි වැසිකිළි පද්ධතිය ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් දරුවන්ගේ සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් වැසිකිළි පද්ධතියක් ලබාදෙන ලෙස ප්‍රධාන ගුරුතුමිය ද අප වෙතින් ඉල්ලීම් කර ඇති බැවින් සභා අරමුදලින් මෙම පෙර පාසලට අවශ්‍ය කරන වැසිකිළි පද්ධතියක් සකස් කර දීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින් ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

බල ප්‍රදේශයේ ලියාපදිංචි පෙර පාසලක් වන මෙම පෙර පාසලේ දරුවන්ගේ සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් අත්‍යාවශ්‍ය වැසිකිළි පද්ධතිය සහා අරමුදලින් සකස් කර දීම සුදුසු බවත්, මෙම සභා තීරණය ගරු ආණ්ඩුකාරතුමන් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලැබීමෙන් අනතුරුව විධිමත් ක්‍රම වේදයන්ට යටත්ව සකස් කර දීම  සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 02**

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය LDSP යටතේ 03 වන සහ 04 වන මූලික වාරිකය සඳහා මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමට සුදුසු ව්‍යාපෘතියක් මේ වන විටත් සකස් කර ඇති, පළාත් පාලන ආයතන සිව් අවුරුදු සංශෝධිත සැලැස්මට අනුව එහි අන්තර්ගත යෝජනාවලියේ සඳහන් යෝජනා ප්‍රමුඛතාවය අනුව තෝරාගෙන ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත යොමු කරන ලෙස දන්වා ඇති බැවින් පළාත් පාලන ආයතන සංශෝධිත සංවර්ධන සැලැස්මේ අන්තර්ගත 03 වන ප්‍රමුඛ යෝජනාව වන මොණරාගල  සිරිමාවෝ බණ්ඩාරනායක ළමා  උද්‍යානය සංවර්ධනය කිරීමේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී සභාවෙන් කළ විමසීම් වලට අනුව මෙහි පළමුවන සහ දෙවන ව්‍යාපෘති වල වැඩ මේ වන විට අවසන් වී ඇති බවත් ඒවාට අදාල ප්‍රතිපාදන ඒ ආකාරයෙන්ම ලැබුණු බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ අදාල සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතාවය අනුව අන්තර්ගත මොණරාගල  සිරිමාවෝ බණ්ඩාරනායක ළමා  උද්‍යානය සංවර්ධනය කිරීමේ 03 වන යෝජනාව අදාල ප්‍රතිපාදන වලට යටත්ව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යොජනා අංක 03**

2022 වර්ෂයට අයත් පහත සඳහන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

**2022 වර්ෂයේ මොනරාගල ප්‍රාදේශීය සභාවේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම**

| අනු අංකය | පුහුණු වැඩසටහනේ නම |
|---|---|
| 01 | කාර්යාල කළමනාකරණය |
| 02 | පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම |
| 03 | කාර්යය පටිපාටි සකස් කිරීම |
| 04 | තිරසර සංවර්ධන ඉලක්ක |
| 05 | ගැටුම් කළමනාකරනය |
| 06 | නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම |
| 07 | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 08 | පළාත් පාලන නීති කටයුතු |
| 09 | පළාත් පාලන ආයතනය තුළ මූල්‍ය කළමනාකරණය |
| 10 | ඵලදායිතාවය |
| 11 | දේපල තක්සේරුකරණය |
| 12 | භෞතික සැලසුම්කරණය තුලින් ආදායම් ප්‍රවර්ධනය කිරීම |
| 13 | ආකල්ප සංවර්ධනය |
| 14 | ප්‍රසම්පාදනය |
| 15 | දුක් ගැනවිලි කළමනාකරණය |
| 16 | ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ පුහුණු වැඩසටහන් |
| 17 | වාහන නඩත්තුව හා අනතුරුවලින් ආරක්ෂා වීම |
| 18 | GIS/GPS තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන |
| 19 | පරිගණක සිතියම් ගත කරනය |
| 20 | SIGAS & PAYROL |
| 21 | ACSES DATA BASE |
| 22 | EXCEL & WORD |
| 23 | POWER POINT |
| 24 | POTO SHOP |
| 25 | ප්‍රථමාධාර ලබා දීම හදිසි අවස්ථාවකදී කටයුතු කළ යුතු ආකාරය. |
| 26 | ශාරීරික යෝග්‍යතාවය සහ යහ පැවැත්ම |
| 27 | බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම |
| 28 | ආයතනය තුල සිටින නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල්වල අය වෙනුවෙන් අවුරුදු උත්සවයක් සංවිධානය කිරීම. |
| 29 | එක් දින ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීම. |
| 30 | වර්ෂය තුල සුහද හමුවක් සංවිධානය කිරීම |
| 31 | උසස් පරිගණක පුහුණු වැඩසටහන් |
| 32 | උද්‍යාන අලංකරණය සහ නාගරික ගෙවතු වගාව |
| 33 | සභා රීති |

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී සභාවෙන් කළ විමසීම් වලට අනුව යම් යම් ව්‍යාපෘති භාර නිලධාරීන් ආයතනයට පැමිණි අවස්ථා ගණනාවකදීම මෙම සැලැස්ම ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් විමසීම් කරන බවත්,මෙහි අන්තර්ගත පුහුණු වැඩසටහන් සඳහා 2022 වර්ෂයේ අය වැයෙන්ද රු.400,000.00 ක මුදලක්ද වෙන් කර ඇති බවටත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

2022 වර්ෂයට අදාලව සකස් කර ඇති ආයතනයට අදාල මෙම මානව සම්පත් සංවර්ධන සැලැස්ම ක්‍රියාතමක කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 04**

covid 19 වසංගත රෝගී තත්ත්වය හේතුවෙන් පළාත් පාලන ආයතන වල ගරු මහජන නියෝජිතයින් සම්බන්ධ කරගෙන විපතට පත් ජනතාව වෙනුවෙන් සහන ආහාර ද්‍රව්‍ය ලබාදීම සඳහා මොණරාගල ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා කිහිපදෙනෙකු මාස තුනක් ඇතුළත නැවත පියවීමේ පදනම මත 2020 වර්ෂයේ අප්‍රේල් මස සභා අරමුදලින් අත්තිකාරම් මුදල් ලබා ගත් අතර ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු මෙම මුදල් නිසි පරිදි පියවා ඇති නමුත් පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙකු මේ වන තෙක් එම මුදල් සම්පූර්ණ වශයෙන් පියවා අවසන් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර අවස්ථා ගණනාවකදීම දැනුවත් කළද ගෙවා නොමැති මෙම මුදල් අය කර ගැනීම සම්බන්ධව සභාවේ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

| | |
|---|---|
| 01.ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ආර් උපුල් මයා | රු.250.000.00 |
| 02. ප්‍රාදේශීය සභා මන්ත්‍රී ක්‍රිෂාන්ත රත්නායක මහතා | රු.250.000.00 |
| 03. ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනත් ගුණවර්ධන මහතා | රු.100,000.00 |

එම යෝජනාව සුදුසු බවට පී.බණ්ඩාර ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මේ සඳහා තවදුරටත් ගෙවීම් කාලයක් ලබා දිය නොහැකි බවත්,මෙය විගණනයටද භාජනය වී ඇති බැවින් 2021 වර්ෂයේ ගිණුම සකස් කිරීමට ගැටලුවක් වී ඇති බැවින් දින තුනක් ඇතුලත මේ සඳහා කඩිනම් විසඳුමක් ගත යුතු බවට සභාවෙ සාකච්ඡා විය. ඉන් පසුව මෙම අත්තිකාරම් පියවීම සඳහා මෙම මස 30 දින වන තෙක් කාලය ලබා දෙන ලෙසත් එම කාල සීමාව ඇතුළත අනිවාර්යයෙන්ම අදාල මුදල් ගෙවා නිම කරන බවත් අදාල මන්ත්‍රීවරුන් සභාවට ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

අදාල මන්ත්‍රීවරුන් පොරොන්දු වූ ආකාරයට 2022.04.30 වන දිනට ප්‍රථම මෙම හිඟ අත්තිකාරම් මුදල් ගෙවා නිම කිරීමටත් , එම දින වන විට මෙම මුදල් සභාවට අය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 05**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සභා අරමුදලින් සිදු කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරි පත් කරනු ලබන යෝජනාව.

01. පැරණි සති පොළ භූමිය තුළ නව තොග කඩ කාමර සංකීර්ණයක් ඉදිකිරීම.

02. මොනරාගල බිබිල මාර්ගයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අසල ඇති සභාවට අයත් ශරීර සුවතා උද්‍යානය තුළ ඉදිකර ඇති ගොඩනැගිල්ලෙහි ආහාර ලබා දීමට හැකි වන ආකාරයට හෙළ බොජුන් හලක් සකස් කිරීම.

03. බෙහෙත් ගබඩාව පාරේ බෙහෙත් ගබඩාව දක්වා වන මාර්ග කොටසෙහි අබලන්වූ ස්ථාන සඳහා බොරලු යොදා අලුත්වැඩියා කිරීම.

04. නගරයේ පැරණි වැසිකිළි සහිත ස්ථානයේ සකස් කරන ලද කඩ කාමර හතර ඉදිරිපිට කාණුව අලුත්වැඩියා කිරීම.

05. නගරය පුරා පදික වේදිකාවල අබලන් ස්ථාන සකස් කර තීන්ත ආලේප කර නගරය අලංකරණය කිරීම.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
මෙහිදී බිබිල මාර්ගයේ ශරීර සුවතා උද්‍යානය තුළ ඉදිකර ඇති ගොඩනැගිල්ලෙ උඩු මහලේ ආහාර ලබා දීමට හැකි වන ආකාරයේ හෙළ බොජුන් හලක් සකස් කළ යුතු අතර මෙය අංග සම්පූර්ණව සකස් කර විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කරමු බවත්, ඒ වගේම එහි පවත්වාගෙන යනු ලබන ශරීර සුවතා ඒකකයට අත්‍යාවශ්‍ය උපකරණ කිහිපයක් ද මිල දී ගත යුතු බවත්,ඒ වගේම එම උද්‍යානයට අවශ්‍යතාවය මත අඩු ස්ථාන සඳහා කොන්ක්‍රීට් බංකු කිහිපයක් ගස් යට තැබිය යුතු බවටත් ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී.ඒ වගේම මෙහි සඳහන් බෙහෙත් ගබඩාව මාර්ගය අයිති වන්නේ පළාත් සභාවට වන අතර නමුත් මෙම මාර්ගය භාවිතා කිරීමේදී මහත් අපහසුතාවයන්ට මුහුණ පාන බවට ජනතාව විසින් විටින් විට අප වෙත දැනුම් දෙන බැවින් මෙම මාර්ගයේ අපහසුව ඇති ස්ථාන ග්‍රැවල් යොදා සකස් කර දිය යුතු බවටද ගරු සභාපතිතුමා විසින් යෝජනා කර සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් කරන ලද මෙම යෝජනා සියල්ලම ක්‍රියාත්මක කිරීම සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද මෙම සියලුම අලුත්වැඩියා හා සංවර්ධන කටයුතු මෙන්ම මේ සඳහා අවශ්‍ය මිල දී ගැනීම්ද විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් සිදු කර පසු විපරම් කරමින් ඒවා පවත්වාගෙන යාම සුදුසු බවට විරෝධතාවයක්ද නොමැතිව සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 06**

කුඹුක්කන සංචාරක මධ්‍යස්ථානයට සහ බිබිල පාරේ ඇති ළමා උද්‍යානය සඳහා පොත් පෙට්ටි කිහිපයක් සකස් කර නිසි පරිදි ස්ථානගත කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතා යොදවා ආරක්ෂා කර සුදුසු ස්ථාන තෝරා ගැනීමෙන් අනතුරුව මෙම පොත් පෙට්ටි ස්ථාන ගත කිරීමට පියවර ගැනීම සුදුසු බවත්, එම ක්‍රමය සාර්ථක වන්නේනම් අත්‍යාවශ්‍ය තවත් තෝරා ගත් ස්ථාන කිහිපයකම මේවා ස්ථාන ගත කිරීමත්, මෙම පොත් පෙට්ටි විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් සකස් කර පවත්වාගෙන යාම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත  කරන ලදි.

**යොජනා අංක 07**

මොනරාගල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක තනතුර දරන ආර්.එම්.ආරියරත්න මහතා විසින් ප්‍රාදේශීය සභාවට අයත් සියලුම වෙළඳසැල් හා වරිපනම් බදු අය කිරීමත් , පොල පරීක්ෂා කිරීම් හා වෙනත් ආදායම් අය කිරීම සම්බන්ධයෙන් දැනට ලබා දෙනු ලබන රු.5000.00 ක පරිවර්තිත ගමන් වියදම් දීමනාව වැඩි කර ලබා දීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

හිඟ බදු කුලී අය කර ගැනීමේ කටයුතු මෙන්ම අදාල සියලුම රාජකාරී කටයුතු මහත් කැපවීමෙන් යුතුව ඉටු කරනු ලබන මෙම ආදායම් පරීක්ෂක මහතාට මෙතෙක් ගෙවනු ලබන පරිවර්තිත ගමන් වියදම් දීමනාව රුපියල් 1000 කින් වැඩි කර ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවත්, මෙය කොමසාරිස්තුමන්ගේ අනුමැතියට හා උපදෙස් වලට යටත්ව ලබා දීම  සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත  කරන ලදි.

**යොජනා අංක 08**

2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් හිඟ වශයෙන් 18,000,000 (එක්කෝටි අසූ ලක්ෂයක්) පවතින අතර මෙයට අදාලව 2022 වර්ෂයේ දේපළ තහනමට ගැනීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

බල ප්‍රදේශයේ සියලුම ජනතාව වෙනුවෙන් ප්‍රාදේශීය සභාවක් වශයෙන් සියලුම යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරන බවත් ඡන්දය බලාපොරොත්තුවෙන් වැඩ කිරීමේ අරමුණක් තමන්ට නොමැති බවත් ගරු සභාපතිතුමන් මෙහිදී ප්‍රකාශ කර සිටි අතර වරිපනම් බදු නොගෙවන අයගේ බදු අය කර ගැනීම ජංගම සේවා මගින් හෝ අය කර ගත යුතු අතර මෙසේ නොගෙවන අයගේ දේපල තහනමට ගැනීමට කටයුතු කළ යුතු බවද ගරු සභාපතිතුමා විසින් යෝජනා කර සිටින ලදි. එම යෝජනාවද සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාවන් සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

2021 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා නොගෙවන සියලුම වරිපනම් හිඟ මුදල් අතරින් රු.5000.00 ඉක්මවා හිඟ ඇති ස්ථාන වල දේපල තහනමට ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත් අනෙකුත් හිඟ මුදල් ජංගම සේවා මගින් අය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යොජනා අංක 09**

ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් යන්ත්‍රෝපකරණ සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධිත මිල ගණන් යටතේ ගාස්තු අය කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

| යන්ත්‍රෝපකරණ වර්ගය | කලින් පැවති මිල ගණන | සංශෝධනය සඳහා ඉදිරිපත් කරන මිල ගණන |
|---|---|---|
| JCB යන්ත්‍රය | පැයකට රු. 2750/= | පැයකට රු. 3500/= |
| මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය | පැයකට රු. 3500/= හා පැයකට ඩීසල් ලී. 10 ක් | පැයකට රු. 4000/= හා පැයකට ඩීසල් ලී. 10 ක් |
| රෝලර් යන්ත්‍රය | පැයකට රු. 4000/= | පැයකට රු. 5000/= |

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී රෝලර් යන්ත්‍රය පිට වැඩ සඳහා ගෙන ගියහම සති කිහිපයක්ම ප්‍රමාද වන නිසා මේ සඳහා ප්‍රමාද ගාස්තුවක්ද අය කළ යුතු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙහිදී මෙම රෝලර් යන්ත්‍රයේ සේවය කරනු ලබන්නේ අනියම් වැටුප් ලබන අයෙකු බැවින් අදාල රියදුරු මහතාට සහා අරමුදලින් ගෙවන දීමනාවත් රෝලර් යන්ත්‍රයෙන් මසකට සභාවට ලැබෙන ආදායමත් සන්සන්දනය කර බලා අදාල රියදුරු මහතාට ගෙවන දීමනාවට වඩා අඩු මුදලක් එම යන්ත්‍රයෙන් මාසිකව ලැබෙන ආදායම වන්නේනම් එය පිට සේවාවන් වෙනුනේ ලබා දීම තේරුමක් නොවන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටිල ලදී.

තවද වර්ථමානයේ ඉන්ධන මිල ගණන් සීඝ්‍රලෙස ඉහල ගොස් ඇති නිසා ආයතනයට අයත් ගලි රථයේ සේවාවන් කොට්ඨාශයෙන් පිට සිදු කරනු ලබන සේවාවන් වලදී අය කරනු ලබන ගාස්තුව වෙනස් නොකර කිලෝමීටර් 01 කට අය කරනු ලබන මුදල රුපියල් 100.00 සිට 200.00 දක්වා වැඩි කර අය කිරීම සුදසු බවටත් මෙම සියලුම ගාස්තු අය කිරීම් ගැසට් පත්‍රයේ එල කරන තෙක් මෙතැන් සිට අය කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමන් විසින් සභාවට නැවත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව ද  සුදුසු බවට තමෝදිරම් ජයපීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනා සියල්ල සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් මෙසේ යෝජනා කරන ලද සභාව සතු යන්ත්‍රෝපකරණ වල අය කිරීමේ සංශෝධිත ගාස්තු සියල්ම ගැසට් මගින් එල කර විධිමත් ක්‍රම වේදයන්ට යටත්ව අය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවටත්, පවතින තත්ත්වයත් සමඟ මෙම සියලු ගාස්තු ගැසට් පත්‍රයේ එල කරන තෙක් මෙතැන් සිට ගාස්තු වැඩි කර අය කිරීම සුදුසු බවටත්, ගලි රථය කොට්ඨාශයෙන් පිට සිදු කරනු ලබන සේවාවන් වලදී අය කරනු ලබන ගාස්තුව වෙනස් නොකර කිලෝමීටර් 01 කට අය කරනු ලබන මුදල රුපියල් 100.00 සිට 200.00 දක්වා වැඩි කර අය කිරීම සුදසු බවටත්, රෝලර් යන්ත්‍රය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කළ සේ අදාල රියදුරු මහතාට සහා අරමුදලින් මසකට ගෙවන දීමනාවත් රෝලර් යන්ත්‍රයෙන් මසකට සභාවට ලැබෙන ආදායමත් සන්සන්දනය කර බලා අදාල රියදුරු මහතාට ගෙවන දීමනාවට වඩා අඩු මුදලක් එම යන්ත්‍රයෙන් ලැබෙන ආදායම වන්නේනම් එය පිට සේවාවන් වෙනුවෙන් ලබා දීම තේරුමක් නොවන බැවින් එම යන්ත්‍රය ආයතනයේම රඳවා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත  කරන ලදී.

**යොජනා අංක 10**

| අනු අක | වාහන අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | PF 7419 | කැබ් රථයේ වාර සේවා සිදු කිරිම | 20960.00 |
| 02 | PF 7419 | කැබ් රථයේ වාර සේවා සිදු කිරිම | 38110.00 |
| 03 | PF 7419 | කැබ් රථයේ වායු සමීකරණ පද්ධතිය අලුත් වැඩියා කිරීම | 13200.00 |
| 04 | 252-6330 | කැබ් රථයේ වාර සේවා සිදු කිරිම | 26090.00 |
| 05 | RS -1800 | මෝටර්ග්‍රේඩරයට ග්‍රීස් බකට් 01 ක් මිලදී ගැනීම | 22000.00 |

| | | | |
|---|---|---|---|
| 06 | RS -1800 | එහි- කටින් ඒජ් හා එන්ඩ්බීඩ් සවිකිරීම | 6700.00 |
| 07 | RS -1800 | එහි- රේල් ගයිඩ් ආම්4 පුරවා රේල් ගයිඩ් ලොක් 8 සෑදීම | 36000.00 |
| 08 | RS -1800 | වාර සේවා සිදු කිරිම | 26230.00 |
| 09 | RS -1800 | 1300 X 24 ටියුබ් 01 ක් දැමීම | 11400.00 |
| 10 | ZA 5061 | බැකෝලෝඩරයේ හයිඩ්‍රොලික් ඔයිල් 20L ක කෑන් 01ක් මිලදී ගැනීම | 21500.00 |
| 11 | ZA 5061 | බැකෝලෝඩරයේ අමතර කොටස් මිලදී ගැනීම | 64940.00 |
| 12 | ZA 5061 | එහි- මල්ටියේ හෝස් එක සවි කිරීම | 6000.00 |
| 13 | ZA 5061 | එහි- පිටුපස බකට් එකෙහි I එක පෑස්සීම | 7800.00 |
| 14 | ZA 5061 | වාර සේවා සිදු කිරිම | 42371.91 |
| 15 | LL 7682 | කෘෂ කැබ් රථයේ ලැම්ප් එකක් දැමීම | 1800.00 |
| 16 | LL 7682 | එහි- බෆර් එක ඇද ඇරීම | 2500.00 |
| 17 | LL 7682 | එහි- වාර සේවා සිදු කිරිම | 21450.00 |
| 18 | LL 6980 | ටිපර් රථයේ වාර සේවා සිදු කිරිම | 44050.00 |
| 19 | LL 6980 | එහි- පිටු පස ලාම්පු බල්බ්,ටේප් එක දැමීම | 4000.00 |
| 20 | LM 3078 | ගලි රථයේ වාර සේවා සිදු කිරිම | 32700.00 |
| 21 | LM 3078 | එහි- කැසට් රෙකෝඩරය සවි කිරීම | 9990.00 |
| 22 | | 825 X 16 CEAT ටයර් දෙකක් මිලදී ගැනීම | 97900.00 |
| 23 | LF 2698 | රථයේ වාර සේවා සිදු කිරිම | 32120.00 |
| 24 | GC 5148 | ගිනි නිවන රථයේ අලුත් වැඩියා කටයුතු | 17300.00 |
| 25 | GC 5148 | ගිනි නිවන රථයේ අලුත් වැඩියා කටයුතු සඳහා වැඩ කුලිය | 28600.00 |
| 26 | RD 4488 | ට්‍රැක්ටර් රථය සඳහා ටිපර් හෝස් එක සහ ගියර් ඔයිල් 5ක් මිලදී ගැනීම | 10600.00 |
| 27 | RD9406 | ට්‍රැක්ටර් රථයේ ක්ලච් පද්ධතිය අලුත් වැඩියා කිරීම | 22750.00 |
| 28 | 37-9430 | ට්‍රැක්ටර් රථයේ හයිඩ්‍රොලික් පද්ධතියේ අළුත්වැඩියා කටයුතු | 45000.00 |
| 29 | 37-9430 | ට්‍රැක්ටර් රථයේ හයිඩ්‍රොලික් පද්ධතියේ උපකරණ මිල දී ගැනීම සහ වැඩ කුලිය | 47380.00 |
| 30 | 37-9430 | වාර සේවා සිදු කිරීම | 27850.00 |
| 31 | UP LF-2698 | ගලි රථය අලුත් වැඩියා කිරීම | 697250.00 |

එම යෝජනාව සුදුසු බවට කේ. එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

අදාල පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඉදිරිපත් කර ඇති මෙම වාහන අලුත්වැඩියා කටයුතු සහ අමතර කොටස් යෙදීම, වාර සේවා කටයුතු සුදුසු ආකාරයට විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සන්ධ්‍යා අනුරුද්ධිකා මහත්මිය විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ගල්කඩ කරකොළයාය මාර්ගය කඳු බෑවුම් සහිත මාර්ගයක් වන බැවින් මෙම මාර්ගය බොහෝ අවස්ථාවන් වල මෝටර්ග්‍රේඩර් කර සංවර්ධනය කළ ද ඉතා ඉක්මනින් අබලන් තත්ත්වයට පත්වන බැවින් මෙම මාර්ගය සභා අරමුදලින් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රී තුමිය විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම සංවර්ධන කටයුතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 05.3 ප්‍රාදේශීය සභා ගරු උප සභාපති ප්‍රදීප් විජේරත්න මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කළුගම්මුල්ල රදාන මාර්ගය මේ වන විට ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් මෙම මාර්ගය සභා අරමුදලින් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

එම යෝජනාව සුදුසු බවට කේ. එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම සංවර්ධන කටයුතු ප්‍රදේශයේ මහජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් සිදු කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

## 06. ආදායම් වියදම් වාර්තාව සහා සම්මත කිරීම

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සහා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2022.03.01 දින සිට 2022.03.31 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ සහ සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ විරෝධතාවයන් ද නොමැති ව පිළිගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. කමිටු වාර්තා සලකා බැලීම

ඉදිරිපත් වී නොමැත

## 08. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරිම බැවින්,වෙනත් කරුණු සමහම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

### 08.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා

රටක් දියුණු කළ හැක්කේ එම රටේ අධ්‍යාපනයෙ දියුණුවත් සමඟ වන අතර මොනරාගල දිස්ත්‍රික්කයේ දරුවන් පාසල් අධ්‍යාපන කටයුතු මෙන්ම විෂය සමගාමී කටයුතු වලදීත් විභාග කටයුතු වලදීත් ඉතා හොඳ දස්කම් පෙන්වා ඇති අතර පසුගිය ශිෂ්‍යත්ව විභාගයේදී ද මදුරුකැටිය මහා විදුහලේ දරුවකු ශිෂ්‍යත්ව විභාගයෙන් ඌව පළාතෙන් ම ප්‍රථම ස්ථානය ලබාගෙන තිබීම ප්‍රදේශයටම ගෞරවයක් වන අතර ඉදිරි කාලය තුළදී මොනරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ශිෂ්‍යත්ව විභාගය ,අපොස සා.පෙළ විභාගය සහ උසස් පෙළ විභාග වලින් ඉහළ ලකුණු ගන්නා දරුවන් දහදෙනා බැගින් තෝරාගෙන ඔවුන්ගේ දෙමාපියන්ද ගෙන්වා යම්කිසි ත්‍යාගයක් ලබාදී ඔවුන්ව ඇගයීමේ වැඩසටහනක් දේශපාලනයෙන් තොරව ඉදිරියේදී ප්‍රාදේශීය සභාව හරහා දියත් කිරීමට කටයුතු කරමු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදි.

ඒ වගේම මේ වන විට රට තුළ ඇතිවී තිබෙන තත්ත්වයත් සමග ජනතාව ඉතාමත් අසරණ තත්ත්වයකට පත්ව ඇති අතර මේ මොහොතේ දේශපාලන වාසි බලාපොරොත්තුව කටයුතු කිරීමේ කිසිම උවමනාවක් තම පක්ෂයේ අයට නොමැති අතර, නමුත් මහජන නියෝජිතයින් වශයෙන් ජනතාවගේ විරෝධතා වලදී සහයෝගය දක්වන බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර ජනතාව විසින් පවත්වනු ලබන සෑම විරෝධතාවයක දී ම දේපළ හානි ජීවිත හානි ආදී කැරලිකාරී තත්ත්වයන්ගෙන් මිදී කටයුතු කළ යුතු අතර, නමුත් විරෝධතාවයක් නිවැරදිව ප්‍රකාශ කළ හැක්කේ මැතිවරණ අවස්ථාවකදී බවද ගරු මන්ත්‍රීතුමන් සඳහන් කර සිටින ලදි.

රට තුළ මෙවැනි උග්‍ර ප්‍රශ්නයක් පවතින මොහොතක ජනතාවට සහන ලබා දිය හැකි වන අයුරින් දේශපාලනයෙන් තොරව සේවය ලබා දෙන ලෙසත් අපි සියලු දෙනාම එකතු වී ජනතාව කුපිත නොකර හැකි සෑම අවස්ථාවකදීම සාමකාමීව කටයුතු කරමු බවද ගරු මන්ත්‍රීතුමන් සඳහන් කල අතර

මොණරාගල ප්‍රදේශයට ඉන්ධන පිරවුම්හල් 5 ක් පමණ ඇති කිරීම සම්බන්ධව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුමේදා ජී ජයසිංහ මැතිනියට ස්තූතිය පුද කර සිටින බවත් එලෙස නොවී තිබුණේනම් මෙම ප්‍රදේශයේ ඉන්ධන ගැටලුව තව දුරටත් උග්‍ර අතට හැරෙනා බවත් ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

ජාතික විභාග වලින් ඉහල ලකුණු ලබා ගන්නා සිසුන්ට ප්‍රාදේශීය සභාව වශයෙන් ඇගයීමට ලක් කිරීමේ වැඩසටහනක් දියත් කිරීම කාලීන වශයෙන් වටිනා යෝජනාවක් වන අතර ඉදිරි සභා වාරයකදී කල් දී ඇති යෝජනා අවස්ථාවකට මෙම කාරණාව ඇතුලත්කර සභා තීරණයක් ගෙන ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

ඒ වගේම මොනරාගල තෙල් හිඟයක් පෙන්නුම් කරන්නේ පිට පළාත් වල සමහර අය විසින් විශාල කෑන්, භූලි වැනි උපකරණ ගෙනැවිත් මෙම ප්‍රදේශයේ ඇති ඉන්ධන පිරහුම් හල් වලින් තෙල් රැගෙන යාමත් ඒ වගේම බස් රථ හිමියන් විසින් වැඩිපුර තෙල් ලබාගෙන ගබඩා කරගෙන තිබීමත් යන කාරණා මත ඉන්ධන පිරවුම්හල් වල මෙවැනි තත්ත්වයක් හට ගෙන ඇති අතර නිසි කළමනාකාරිත්වයකින් යුක්තව මෙම කටයුතු පවත්වාගෙන යනවා නම් තෙල් හිඟයක් හෝ මෙවැනි ගැටලුකාරී තත්ත්වයක් ඇති නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

ඒ වගේම සාමකාමීව විරෝධතා ගෙන යන අයගේ වැරැද්දක් නොමැති අතර මේ අතරින් විවිධ අන්තවාදී පාක්ෂිකයින් ප්‍රචණ්ඩ ලෙස හැසිරෙමින් කටයුතු කරන බැවින් මේවා පාලනය කිරීම සඳහා කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කිරීමට සිදුවන බවද ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 08.2 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.ආර්.උපුල් මැතිතුමා</u>

වර්තමානයේ රටේ පවතින තත්වත්යට ජනතාව විරුද්ධ ව නැඟී සිටියත් මෙවැනි දරිද්‍රතාවය ඇතිවීමට මූලික වශයෙන් කොවිඩ් වසංගතය ප්‍රබල ලෙස බලපෑ අතර මෙරට කොරෝනා රෝගීන් පාලනය කරමින් ජීවිත හානි අවම කරමින් රටේ ජනතාවගේ ජීවිත බේරා ගැනීමට අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විශාල කැපකිරීමක් සිදු කළ අතර අඩු ආදායම්ලාභී සියලු පවුල් වලට අවස්ථා කිහිපයකදීම මුදල් ආධාර ලබාදීමත් එන්නත් කරන කටයුතු නිසි කළමනාකාරීත්වයකින් යුක්තව සිදු කළ නිසා කොරෝනා මාරයාගෙන් රට බේරා ගැනීමට හැකිවූ බවත්, මේ සඳහා විශාල මුදලක් රජයට වැය කිරීමට සිදු වූ බැවින් රටේ මේ ආකාරයෙන් ප්‍රශ්න නිර්මාණය වී ඇති බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

1977 න් පසුව බිහිවූ සියළුම දේශපාලන නායකයින් වර්තමානයේ රටේ ඇති වී තිබෙන තත්වයට වගකිව යුතු බවත්, අප කාටත් මෙය දරා ගත නොහැකි තත්ත්වයක් වුවත් ප්‍රචණ්ඩකාරී ලෙස අරගල ඇති කරමින් ජීවිත හානි ,දේපළ හානි සිදු වන ආකාරයට විවිධාකාරයෙන් කලහකාරී හැසිරීම් සිදු නොකර මෙම කටයුතු කිරීමට කවුරුත් වගබලා ගත යුතු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදි.

මේ වන විට අතිගරු ජනාධිපතිතුමන් කැබිනට් මණ්ඩලය ද වෙනස් කරමින් නව අමාත්‍ය ධූර නැවත ලබා දෙමින් විධිමත් වැඩපිළිවෙලකට යාමට උත්සාහ දරන අතර මේ වන විට ගුරුවරුන්ගේ ප්‍රශ්නය, පොහොර ප්‍රශ්නය සඳහා විසඳුම් ලබාදී ඇති අතර වත්මන් රටේ පවතින තත්ත්වයටද ගරු

ජනාධිපතිතුමන් ඉතා කඩිනමින් විසඳුම් ලබාදී රට ස්ථාවර කිරීමට කටයුතු කරගෙන යන බැවින් අපි සියලු දෙනා බොහෝම සන්සුන්ව මේ වැඩපිළිවෙළ සමඟ එකතු වී සාමකාමීව සහයෝගය ලබා ලබා දෙමු බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරමින් සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

තිස් වසරක් පුරා පැවැති රුදුරු යුද්ධය නිමා කිරීමෙන් අනතුරුව මහින්ද රාජපක්ෂ මැතිතුමන් දෙවියකු ලෙස ජනතාව පිළිගෙන සිටි අතර විවිධ පාක්ෂිකයින් විසින් දේශපාලන වාසි තකා විවිධාකාරයෙ මඩ ප්‍රහාර එල්ල කරමින් මෙවැනි තත්වයන් නිර්මාණය කර ඇති අතර ඒ වගේම මෙම දිනවල පවතින තෙල්, ගෑස් ආදී පෝලිම් වලට හවස් වරුව වන විට පැමිණෙන බහුතරයක් දෙනා සැලසුම් සහගතව ඕනෑකමින් මත්ද්‍රව්‍යා භාවිතා කර පැමණ විවිධ ප්‍රශ්ණ ඇති කරමින් කටයුතු කරන අතර ආරක්ෂක අංශ වල වගකීම වන්නේ මේවා නිසි ලෙස සොයා බලා අවශ්‍යා කටයුතු සිදු කිරීම වුවද එය නිසි ලෙස පාලනය නොවීම මත මෙතරම් ප්‍රශ්න මතු වී ඇති බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 08.3 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සනත් ගුණවර්ධන මැතිතුමා</u>

මේ වන විට රටේ ප්‍රශ්න විශාල ලෙස වර්ධනය වෙමින් පවතින අතර බොහෝ තැන්වල උද්ඝෝෂණ කැරළිකාරී තත්ත්වයන් දැකිය හැකි අතර මේ සෑම උද්ඝෝෂණයකින්ම පැහැදිලි වන්නේ විවිධ දේශපාලන පාක්ෂිකයින් දේශපාලන වාසි බලාපොරොත්තුව එක එක්කෙනාට උදම් අනමින් තම පක්ෂය ඉදිරියට ගැනීමට උත්සාහ දැරීමක් බව සත්‍යා වශයෙන්ම වශයෙන්ම හඳුනා ගත හැකි බවත්, නමුත් කුමන පක්ෂයක් බලයට පැමිණියත් මේ මොහොතේ රට තුළ නිර්මාණය වී ඇති ප්‍රශ්න වලට විසඳුමක් නොවන බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර ඉදිරි සිංහල හා හින්දු අලුත් අවුරුද්දට ජනතාවට අවශ්‍යා භාණ්ඩ ටික තම අත, කර ආභරණ උකස් කර හෝ ගෙදර ගෙනියන නමුත් මෙම අලුත් අවුරුද්දෙන් පසුව මැයි මාසයේ මැද භාගය පමණ වන විට සියලු ජනතාව දරිද්‍රතාවයෙන් පීඩාවට පත්වන බවත්, ගෙවල්වල සකස් කරන බත් මුට්ටි පවා සොරා ගන්නා තැනටම රටේ ප්‍රශ්න උග්‍ර වනවා නියතයි යන්න ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම මේ මොහොතේ අපි සියලු දෙනාම බල ප්‍රදේශයේ අහිංසක ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු සකස් කළ යුතු අතර පැමිණෙන සිංහල අලුත් අවුරුද්දට කන්න වේලක් නොමැතිව කුසගින්නේ සිටින පවුල් විශාල ප්‍රමාණයක් ගම් මට්ටමෙන් අපේ ප්‍රදේශය තුළ ම ජීවත් වන අතර දේශපාලන වාසි නොතකා මේවාට විසඳුම් ලබාදීමට කටයුතු කළ යුතු බවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් මේ මොහොතේ පවතින රජයට පක්ෂපාතී ව කතා කිරීමට තමන් කිසිසේත්ම බලාපොරොත්තු නොවන අතර පාක්ෂිකයින් උසිගන්වා අහිංසක ජනතාව උසිගන්වා පෙළපාලි ඇති කරමින් මන්දිර වටලමින් විවිධ කැරලිකාරි තත්ත්වයන් ඇතිවන ආකාරයට හැසිරෙමින් දේශපාලන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කිරීමට උත්සහ දරණ සියලුම පාලකයින් මේ මොහොතේ රට තුළ නිර්මාණය වී ඇති මෙම දැවැන්ත ප්‍රශ්නවලට විසඳුම මේ ආකාරයෙන් කටයුතු කිරීම නොවන බව තේරුම් ගත යුතු බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම දැවැන්ත ඉන්ධන ප්‍රශ්නයකට ජනතාව මුහුණ පා සිටින අතර මේ ප්‍රශ්නය තුළම බස් රථ හිමිකරුවන්ගේ නිවෙස් වල ඩීසල් මහා පරිමාණයෙන් මේ වන විට පුරවා ගබඩා කර ගෙන ඇති අතර ඔවුන්ගේ බස් ටික බොරුවට පෝලිම් වල නවතා තබා අනිත් මිනිස්සුන්ට අසාධාරණ වන අයුරින් නින්දිතව කටයුතු කරන අතර මේ සියලු ප්‍රශ්න දේශපාලන වාසි තකා හිතාමතා සැලසුම් සහගතව ඇති කරවන ඒවා බවට ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි. ඒ වගේම ගෝඨා go home කිය කියා දේශපාලන වාසි තකා කටයුතු කරනවාට වඩා ඉතා හොඳ මට්ටමේ පවතින බුද්ධිමත් ඔලුගෙඩි සහිත

වගකීම් දැරිය හැකි කිහිප දෙනෙකු එකතු වී සමූහ ආණ්ඩුවක් ගොඩ නංවා රට තුළ නිර්මාණය වී ඇති දැවැන්ත ප්‍රශ්න වලට විසඳුම් සෙවීම, රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම, යන කාරණාවන් අනුව කටයුතු කිරීමට ආරම්භ කිරීම මේ මොහොතේ සිද්ධ විය යුතු එකම විසඳුම වන අතර එසේ නොවුණහොත් රටේ විනාශය අප කාටවත් වැළැක්විය නොහැකි බවත්, රට ශක්තිමත් කිරීමට අපි පෙළගැසී කටයුතු කර උපරිම සහයෝගය ලබා ලබාදෙමු බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදී .

## ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම

පෙරටුගාමී කණ්ඩායම් හා දේශපාලන වාසි තකා කටයුතු කරන විවිධ පක්ෂවල පාක්ෂිකයින් රජය විසුරුවන්න කියා කෑ ගසමින් ජනරැලි පවත්වන අතර 1971 ,89 ,90 යන වර්ෂ වල පැවති තත්ත්වන් රට තුළ නැවත ඇති වුවහොත් මහා විනාශයක් සිදුවන බවත් ,සිංහල අවුරුද්ද සමරන්නට අහිංසක ජනතාවට රුපියල් 10000.00 බැගින් ලබා දීමට රජය විසින් සැලසුම් කර ගෙන ගිය අතර කඩාකප්පල්කාරීන් විසින් ඒ සැලසුම් විනාශ කිරීමට පවුකාර ලෙස කටයුතු කළ අතර නමුත් මොනතරම් කැරලිකාරී තත්ත්වයන් ඇති කලත් බෙබද්දන්ට ආණ්ඩුව වට්ටන්න බැරි බවත්, යහපත් කාලයක් ඉදිරියේදී ඇතිවන අතර ජනතාව වුවද අරපිරිමැස්මෙන් යුතුව බුද්ධිමත්ව කටයුතු කළ යුතු අතර පොහොර ප්‍රශ්නයටත් මේ වන විට ජනතාවට උවමනා ආකාරයට අතිගරු ජනාධිපතිතුමන් විසඳුම් ලබාදී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 08.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අජිත් අගලගඩ මැතිතුමා

තම බල ප්‍රදේශය තුළ ජනතාව වෙනුවෙන් පෙනී සිටිමින් ඔවුන්ට අවශ්‍ය සේවාවන් සපයමින් ප්‍රදේශයේ සංවර්ධනය කටයුතු සිදු කරමින් ඉදිරියට යාම ප්‍රාදේශීය සභාවක වගකීමක් වන අතර, අපට පාලනය කල නොහැකි කිසිදු වෙනසක් රට තුළ සිදු කළ නොහැකි කාරණාවන් සම්බන්ධව මාතෘකා ගෙන එමින් මේ සභාව තුළ ගිරිය පුප්පාගෙන කෑ කෝ ගැසීම කිසිම තේරුමක් නොමැති තත්ත්වයක් වන අතර, පුද්ගලයෙකු වශයෙන් තමන් මෙම බල ප්‍රදේශයේ ඇති අඩුපාඩු සොයා ගෙන ඒ සම්බන්ධව මේ සභාවේ ආරවුල් ඇති කර ගනිමින් කෑකෝ ගැසීමට මේ තාක්කල් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කණගාටු වන බවත් ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

ඒ වගේම 2006 වර්ෂයේ සිට අද දක්වා බොහෝ අත්දැකීම් සහිතව ගරු සභාපතිතුමන් කටයුතු කර ගෙන යන අතර ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉටුවිය යුතු හෝ ප්‍රදේශයේ පවතින යම් යම් තත්වයන් හෝ සංවර්ධන කටයුතු සම්බන්ධව කරුණු කාරණා පමණක් සෑම සභා වාරයකදීම සාකච්ඡාවට බඳුන් කිරීමට කටයුතු කර ඒවාට විසඳුම් ලබාදීමට පියවර ගැනීම තුළින් ආදර්ශමත්ව ඉදිරි කටයුතු කරගෙන යාමට හැකි වන බව ගරු මන්ත්‍රිතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම පසුගිය දිනවල දිගින් දිගටම රටේ පවතින තත්ත්වයන්ට විරුද්ධව ජනතාව විසින් නොයෙක් ආකාරයේ පෙළපාලි පැවැත්වූ අතර ජාතික ජන බලවේගය, ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් පෙනී සිටිමින් වර්තමානයේ තරුණ පරම්පරාව හැසිරෙන ආකාරය ගැන අවබෝධයක් ඇතිකර ගනිමින් මෙවැනි අනර්ථකාරී ක්‍රියාවන් පාලනය කළ හැකි වේද යන්න තමන් ඇතුළු පිරිස නගරය හරහා සැරිසැරීම තුළින් බලාපොරොත්තු වූ බවත් එහිදී ඉතා සාමකාමීව පොදු බැනරයක් ද භාවිත කරමින් තම කණ්ඩායම සමඟ එකතු වූවන් ද සමග එම පෙළපාලිය ඉතාමත් පිලිවෙලට පවත්වා ගැටලුවකින් තොරව විසිර ගිය බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර එවැනි ආකාරයට කටයුතු කිරීම තම පක්ෂයේ විනයානුකූල හැසිරීම වන අතර නමුත් ඊට එහා ගිය බලාපොරොත්තු ඇති අය මෙම පෙළපාලි තුළින්ම ඒ දේවල් ලබා ගැනීමට උත්සාහ දැරීමක් ගන්නා බවට පැහැදිලි කරුණක් බවට පෙනී යන වගක් ඇති බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම විද්‍යාවක් වශයෙන් ඉගෙන ගනු ලබන දේශපාලනය තුළ කටයුතු කිරීමේ දී ඒ සම්බන්ධයෙන් මනා අධ්‍යනයකින් පසුව අවබෝධයකින් යුක්තව බුද්ධිමත්ව තර්කානුකූලව යම් දෙයක් ප්‍රකාශ කිරීමේදී හැල්ලුවට පත් නොවී කරුණු කාරණා හොඳින් අධ්‍යනය කර අවබෝධ කර ගනිමින් තර්කානුකූලව ප්‍රකාශ කළ යුතු අතර මේ සභාවේ කවුරු හෝ වර්තමාන රටේ පවතින ඩොලර් ප්‍රශ්නය ගැන සාකච්ඡාවක් කරනවා නම් එම ඩොලර් ප්‍රශ්නය විසඳීමට ගත හැකි ක්‍රියාමාර්ග හෝ විසඳුම් අවම වශයෙන් පහක් වත් තර්කානුකූලව පෙන්වා දිය හැකි නම් බුද්ධිමත්කම හා අවබෝධය එතන පවතින බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම මහජන නියෝජිතයින් වශයෙන් තමන්ගෙන් ජනතාවට ඉටු විය යුතු යුතුකම් හා වගකීම් තමන් වෙනුවට වෙනත් කෙනකු විසින් සිදු කරනවානම් හෘදසාක්ෂියට එකඟව තමන්ට ඒ දෙස බලා සිටිය නොහැකි බවත්, කවුරු හෝ මේ දේවල් නිවැරදිව සිදු කරනවා නම් රට තුළ මෙවැනි ප්‍රශ්න ඇති නොවන බවත්, ඒ වගේම අපේ රටේ පවතින සම්පත් නිසියාකාරව නිවැරදි ව භාවිතා කිරීම තුළින් ඩොලර් උල්පතක් බවට වුවද පත් කර ගැනීමේ හැකියාවක් පවතින අතර බුද්ධිමත්ව කටයුතු නොකිරීම මත ඒවා අහිමි වී ඇති බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම මේ වන විට වර්තමානයේ රට තුළ නිර්මාණය වී ඇති අඳුරු අගාධයෙන් මිදුන හොඳ කාල වකවානුවක් කෙදිනක ඇතිවේද යන්න තීරණය කළ නොහැකි තත්ත්වයක් පවතින බැවින් මේ වන විට හෘද රෝගීන්ට අත්‍යවශ්‍ය ඖෂධ හා උපකරණ නොමැති වීම නිසා රෝගීන් බලා සිටියදීම මැරී යන ඉතා කණගාටු දායක තත්ත්වයකට හෙට දිනයේ දී මුහුණ දීමට සිදු වන අතර මෙම තත්ත්වයන් සම්බන්ධයෙන් සරලව බලා නොසිටින ලෙසත්, දැවැන්ත ඛේදජනක තත්ත්වයක් රටේ නිර්මාණය වෙමින් පවතින බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටි අතර ඉදිරි කාලයේ දී හෝ අපි බුද්ධිමත්ව නිවැරදිව හැදෑරීමකින් යුතුව කටයුතු කර මෙම තත්ත්වයෙන් රට ගොඩ ගැනීමට එකතුවී සහය වෙමු බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

මේ මොහොත වන විට රටේ ප්‍රශ්නයක් පවතින බව සැබෑ කාරණාවක් වන අතර බොහෝ පෙළපාලිවල ගැටලුකාරී තත්ත්වයන් ඇති කරන්නේ අන්තවාදී අයවලුන් බවත් ගරු සභාපතිතුමා සඳහන් කර සිටි අතර ප්‍රාදේශීය සභාව තුළ දී පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළ යුතු දේවල් සම්බන්ධයෙන් වාද විවාද කිරීම අනවශ්‍ය කාරණාවක් බව හැමෝම කල්පනාවට ගත යුතු කාරණාවක් බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 08.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - චාමර නානායක්කාර මැතිතුමා

හුලන්දාව බිබිල මාර්ගයේ විශේෂයෙන්ම 22 කොටසේ සිට නක්කල දක්වා වූ ප්‍රධාන මාර්ගය දෙපස පවතින කාණු පද්ධතිය වැසි සමයත් සමග අවහිර වී ප්‍රධාන මාර්ගයට වැසි ජලය සමග පස් වැලි බොරළු ආදිය ගලා විත් තිබීම හේතුවෙන් පාපැදිවලින් ගමන් ගන්නා අයවලුන්ට ඉතා අනාරක්ෂිත තත්ත්වයක් ගෙන දී ඇති අතර මේ වන විටද මෙම තත්ත්වය මත කිහිපදෙනකුම අනතුරට පත් වී ඇති බැවින් මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියට ලිඛිතව දැනුම් දී අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම මහජන නියෝජිතයින් වශයෙන් වර්තමානයේ රට තුළ නිර්මාණය වී ඇති ව්‍යාකූලතාවය සම්බන්ධව කතා කළ යුතුම වන අතර විශේෂයෙන්ම මෙම තත්ත්වය එක්දහස් නවසිය හතළිස් අටේ සිට පැවත එන බරපතලම ආර්ථික කඩාවැටීම වන අතර 1953 ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ

ආණ්ඩුවට ගෙදර යාමට සිදුවූයේ හාල් කිලෝ එකක මිල සත 35 කින් පමණ වැඩි වීම නිසා ජනතාව විසින් කරනු ලැබූ උද්සෝෂණ නිසා බවත් ,ඒ වගේම අද වන විට රට තුළ ඇති වී තිබෙන ආර්ථික පසුබෑම නුවණින් දැක එවැනි තත්ත්වයන්ගෙන් රට ආරක්ෂා කරලීම සඳහා 1970, 77 වර්ෂවල පැවති සමගි පෙරමුණ නියෝජනය කළ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් පිට රටවලින් ආනයනය කරන දේවල් අඩුකර අපනයනය ශක්තිමත් කර රට තුළම සියලු කර්මාන්තශාලා ඇති කරමින් දේශීය නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට කටයුතු කළ අතර එවකට සිටි මිනිසුන් මෙය තේරුම් නොගෙන අනවබෝධයෙන් කටයුතු කරමින් ඉතා සැපවත් සංකීර්ණ ජීවිත ගත කිරීමේ අරමුණින් වෙනත් වෙනත් දේවල් පසුපස හඹා යාමත් සමග එම ආණ්ඩුවට ද ගෙදර යාමට සිදු වූ බවත් ,1983 කලබලත් සමඟ 88 ,89 කාල වකවානු තුළ උගත් බුද්ධිමත් තරුණ පිරිස් රටට අහිමි වූ අතර 1994 චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව සමයේදී රටේ පැවති සම්පත් විකුණමින් ආණ්ඩුව කරගෙන ගිය අතර ආර්ථික මට්ටම සෘණ අගයක් ගෙන තිබූ මොහොතක මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට පත්වීමෙන් තිස් වසරක් පුරා පැවති රුදුරු යුද්ධය අවසන් කිරීමේ මූලික අරමුණ ඇතිව ක්‍රියා කළ අතර අද වන විට මේ සෑම දේම රැකගත් පාලකයින් හොරු බවට හංවඩු ගසා ඇති අතර පසුගිය ආණ්ඩුව සමයේදී මෙසේ සිටියා කියන හොරු සම්බන්ධයෙන් සොයා බලා නීතිය ක්‍රියාත්මක කිරීමට ඕනෑ තරම් අවස්ථාව තිබූ අතර අද වනවිට උද්සෝෂණ කරන බොහෝ තරුණ පිරිස් නොයෙක් නොයෙක් ආකාරයට රජය සොරා කෑ බව සඳහන් කරමින් කෑ කෝ ගසන අතර ගෝඨා go home යනුවෙන් ප්‍රකාශයන් සිදු කරන බැවින් මේ තාක් කල් කටයුතු කළ පාලකයින්ට මෙන්ම ජනතාවටද මේවා නිරවුල් කර ගැනීමේ අවස්ථාවක් ඕනෑතරම් තිබුණු අතර එසේ නොකිරීම මත අද වන විට ගෑස් මිල, කිරිපිටි මිල, විදුලිය කැපීම, ඉන්ධන ප්‍රශ්න, අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යාම, විදේශිකයන්ගේ පැමිණීම අවම මට්ටමක පැවතීම සහ ඩොලරයේ අගය සීග්‍ර ලෙස ඉහළ යාම ආදිය ඉතාමත් බරපතළ සෝචනීය තත්ත්වයන් වන අතර ඉදිරි අනාගත පරම්පරාවට විදේශ රටකට ගොස් හොඳ අධ්‍යාපනයක් ලැබීමේ අවස්ථාවක් කෙදිනක පැමිණේ ද යන්න සිහිනයක් බවට පත්වී ඇති අතර දැනට පිටරටවල අධ්‍යයනය ලබන දරුවන්ට ද දෙමාපියන් ද බරපතළ තත්ත්වයට අද වන විට මුහුණ පා සිටින අතර රටේ පවතින මෙම තත්ත්වය හමුවේ පළාත් පාලන මන්ත්‍රීවරුන් වශයෙන් අපගේ කාර්යභාරය කුමක්ද යන්න අප විසින් තීරණය කළ යුතු අතර, මේ වන විට යම් යම් බලවේගයන් පැමිණ මහජනතාව ද නීතිය ද අතට ගෙන පාලනය කිරීමට පටන් ගෙන ඇති අතර මේ ක්‍රමවේදය යටතේ විශ්වාසවන්ත නිවැරදි වැඩපිළිවෙළක් දියත් කිරීම තුළින් ජනතාව නම්‍යශීලී කරගත හැකි බැවින් අප හට ඇති බලතල සමග සාර්ථක වැඩපිළිවෙලක් ඉහළ බලධාරීන්ට හඳුන්වා දිය හැකි නම් එයින් අපට යම්කිසි ගැලවිල්ලක් තිබෙන බැවින් ඒ අනුව කටයුතු කිරීම අනිවාර්යය වන අතර මේ වන විට කඩදාසි හිඟය දැවැන්ත ලෙස රටේ ප්‍රශ්න වලට බලපෑමක් වී ඇති බවත්, ඒ වගේම 70% ක් පමණ පිටරටවලින් ගෙන්වන සියල්ලම මේ වන විට නතර වී ඇති අතර ඉතාමත් අමාරු තත්වයක රට පවතින බැවින් උද්සෝෂණ කරන කණ්ඩායම් විසින්ද රට තව තවත් අගාධයට තල්ලු නොකර සාමකාමීව උද්සෝෂණ පවත්වා රට ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන්න කියාත් පළාත් පාලන මන්ත්‍රීවරුන් වශයෙන් අපි සියල්ල සාකච්ඡා කර නිවැරදි ක්‍රම වේදයකට අනුව සැලසුමක් සකස් කර මේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ට දායකවී අපේ ඉදිරි පරම්පරාව වෙනුවෙන් රට බේරාගැනීමට ක්‍රියා කරමු බවට ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර ඉදිරි සිංහල හා හින්දු අලුත් අවුරුද්ද හොඳින් සැමරීමට සියලු දෙනාට ශක්තිය ලැබේවායි කියා ස්තුතිය පුද කර සිටින ලදි..

## <u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

සාමකාමීව පෙළපාළි පැවැත්වීම වරදක් නොවන අතර අවශ්‍ය අයගේ නිවෙස්වලට ගොස් සාකච්ඡා මාර්ගයෙන් ප්‍රශ්න විසඳා ගැනීමට සියලු දෙනා කටයුතු කළ යුතු බවත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ගෙන් ඉල්ලා සිටින බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 08.6 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.බණ්ඩාර මැතිතුමා

නිදහසෙන් පසුව රට පාලනය කළ සියලුම පාලකයින් ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වයට වගකිව යුතු අතර එයට හේතුව වශයෙන් මේ කිසිම පාලකයෙකු රටට නිසි සේවයක් සිදු කර නොමැති බව වර්තමානයේ රටේ තත්ත්වයත් සමග පැහැදිලි වන කරුණක් බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර පොදුවේ ගත් කල බොහෝ නගරවල ඇති බහුතරයක් වෙළෙඳ ව්‍යාපාරික ස්ථාන බොහෝ විට අයිතිවන්නේ සහ පාලනය කරන්නේ ප්‍රදේශයේ කටයුතු කරන මන්ත්‍රීවරුන් සහ ඇමතිවරුන්ට වන බැවින් මහජනතාව නැගී සිටීම ඉතාමත් සාධාරණ වන අතර ගම් වල සිටින මිනිසුන්ට මේ තත්ත්වය නිසි විදිහට දැනුණේ නැති වුණාට කොළඹ ප්‍රදේශවල ඉඩ පහසුකම් නොමැති නිවාසවල, මහල් නිවාසවල ජීවත් වන සියළු ජනතාවට රටේ පවතින දැවෙන ප්‍රශ්න තදින්ම දැනෙන අතර මේ වන විට විදේශීය සංචාරකයින් පවා රටට ඒම ප්‍රතික්ෂේප කර තිබීම ද දැවැන්ත ප්‍රශ්නයක් වන අතර මේ සියලු දෙයට පාලකයින් වගකිය යුතු බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි. මේ මොහොතේ රටේ පවතින අමාරු තත්ත්වයක් සමග රට භාර ගැනීමට කවුරුත් ඉදිරිපත් වන්නේ නොමැති අතර ජනාධිපතිතුමන්ට ගෙදර යන්න කීවට ව්‍යවස්ථානුකූලව එසේ සිදු කළ නොහැකි බැවින් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව බුද්ධිමතුන් වශයෙන් මේ මොහොතේ එකට එක්ව කටයුතු කළ යුතු අතර සියලු දෙනාගේම සහයෝගය මේ සඳහා ලබාදිය යුතු බව ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදි. ඒ වගේම අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟවීමත් සහ අනිකුත් අත්‍යාවශ්‍ය භාණ්ඩ වල මිල ඉහළ යාමත් සමඟ ජනතාව ඉතාමත් පීඩාවට පත්ව ඇති මොහොතක් වශයෙන් රට ඉතාමත් ආර්ථික පසුබෑමකට ලක්ව පවතින අතර මේ ආකාරයට තව දුරටත් රට අරාජික වීමට ඉඩ තැබීම සිදුකළ නොහැකි බැවින් සියලු දෙනාම එකතු වී මේ රට ගොඩනැගීමට සහයෝගය ලබා දෙමු බවට ගරු මන්ත්‍රී තුමා ප්‍රකාශ කරන ලදී.

මිනිසුන් අරගල කරන්නේ ඔවුන්ට දැනෙන ප්‍රශ්න රට තුළ නිර්මාණය වී ඇති බැවින් වන අතර ඉදිරි තීරණාත්මක කාලය තුළ සියලු පක්ෂවල බුද්ධිමතුන් එක්ව සාකච්ඡා මාර්ගයෙන් පාර්ලිමේන්තු කෑම වියදම හෝ ගමන් වියදම්, වාහන පර්මිට් ,කෝටි ගණන් වටිනා යන එන රථවාහන නවතා හෝ මේ ප්‍රශ්න වලට විසඳුම් සෙවිය යුතු වන අතර රටේ ජනතාව බලාපොරොත්තු වන්නේ ද එය බැවින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නියෝජිතයෙකු වශයෙන් සියලු පක්ෂ එකතු වී මේ රටට සෞභාග්‍යමත් හෙට දවසක් ගොඩනැංවීමට පියවර ගැනීම තමාගේද එකම බලාපොරොත්තුව වන අතර සියලුම දෙනා එකතු වී මේ සඳහා උපරිම සහයෝගය ලබා ලබාදෙමු බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදි.

### ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම

අතිගරු ජනාධිපතිතුමන් විසින් මේ වන විට වෙනස් කරමින් පවතින කැබිනට් මණ්ඩලයට ඔය කියන සියලුම පක්ෂවල නියෝජිතයන්ට ආරාධනා කළ ද ඒ කිසිම කෙනෙක් ඉදිරිපත් නොවීම මත ආණ්ඩු පක්ෂයටම ඒ දේවල් තෝරා බේරා ගැනීමට සිදු වී ඇති බැවින් ඒවාට දොස් පැවරීම සුදුසු නොවන බවත් ඒ වගේම කෙසේ හෝ රටේ මෙම තත්ත්වයට විසඳුම් සෙවීම සිදු කළ යුතුම කාරණාවක් වන අතර සියලු දෙනා බුද්ධිමත්ව කටයුතු කළ යුතු මොහොතක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 08.7 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා

වත්මන් අතිගරු ජනාධිපතිතුමන් විසින් මේ රට භාර ගනිද්දිම මෙම අර්බුදකාරී තත්ත්වය රට තුළ පැවති බැවින් එදා සිට ම එතුමන් ඉතාමත් බුද්ධිමත්ව රටේ පාලනය සැලසුම්සහගතව කරගෙන පැමිණි අතර ආනයනික වාහන ගෙන්වීම නතර කළ අතර කහ ආනයනයද නතර කර දේශීය වශයෙන් කහ වගා කිරීමේ කටයුතු ආරම්භ කිරීම ආදී බොහෝ තීන්දු තීරණ සැලසුම් සහගතව එතුමන් විසින් සකස් කරමින් පැවති අතර වර්තමාන රටේ ඇති වී ඇති ප්‍රශ්න ඇති නොවීමට එතුමන්

මුල සිටම කටයුතු සකස් කර තිබූ නමුත් කුමන හෝ හේතුවකට අද වන විට ජනතාවට අමාරු කාලයක් පැමිණ ඇති බව පිළිගත හැකි කරුණක් වන අතර මේ මොහොතේ අතිගරු ජනාධිපතිතුමන් නිහඬව සිටිමින් රට ගොඩනැගීමේ ක්‍රියාවලිය සකස් කිරීමට අනුගත වෙමින් සිටින අතර නමුත් ජනතාව මේ මොහොතේ හැසිරෙන ආකාරයේ වැරැද්දක් ඇති බවත්, බොහෝ උද්සෝෂණ සඳහා කිසිත් නොතේරෙන කුඩා දරුවන් ,පාසල් දරුවන්, ටියුෂන් යන දරුවන් යොදවා ගනිමින් කටයුතු කරන අතර මේ ආකාරයෙන් කටයුතු කර දරුවන්ගේ ඉදිරි අනාගතයම පාරට ඇද දමමින් රට ගිනි තියන්න උත්සාහ ගන්න එපා යනුවෙන් ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදී.

ඒ වගේම රටේ රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන බහුතරයක් රාජ්‍ය නිලධාරීන් විසින් සිදුකරන වැරදි ක්‍රියාදාමයන්ට රජය වගකිව යුතු නැති බවත්, සංකීර්ණ ජීවිත රටාවන්ට හුරු වීම අවම කර ගනිමින් සරල ජීවිත වලට අපි නැඹුරු විය යුතු අතර දේශීය නිෂ්පාදන ඇති කරමින් දේශීයත්වයට මුල්තැන දෙමින් නිරතුරුවම කටයුතු කළ යුතු අතර රටේ පුරවැසියන් වශයෙන් අපි සියලු දෙනාම මේ මොහොතේ පුරවැසියෙකුගේ යුතුකම නිසි ලෙස ඉටු කළ යුතු වකවානුවක ජීවත් වන අතර අප පරිහරණය කරනු ලබන සියලුම දේවල් ඩොලර් වලට පමණක් යට නොකර දේශීය නිෂ්පාදන දේශීය කර්මාන්තයන් සම්බන්ධයෙන් බොහෝ දෙනකු තුළ පවතින සෘණාත්මක අවබෝධයන් තුරන් කර කටයුතු කළ යුතු අතර බොහෝ සේවාවන් වලදී වටිනාකමක් ලබා දිය හැකි පරිදි මිනිසුන්ගේ ආකල්ප දියුණු විය යුතු බවත්, අපි කියන හැඟීම නොතකා මම යන හැඟීම ඔස්සේ පමණක් කටයුතු කිරීම තුළ තුල මෙම ප්‍රශ්න වලට කෙදිනකවත් විසඳුම් නොලැබෙන අතර මේ රට තුළ නිර්මාණය වෙමින් පවතින මෙම අර්බුධකාරී තත්ත්වය මහා කැරලිකාරී තත්ත්වයකට යාමට ඉඩ නොදී දේශපාලනය පසෙකින් තබා සුබදායි කාරණාවන් බවට පත්කර ගැනීමට සියලු දෙනාම එකතු වී කටයුතු කරමු යන්න ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදි.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

ක්‍රිෂාන්ත රත්නායක ගරු මන්ත්‍රී තුමන් විසින් රටේ තත්ත්වය සම්බන්ධයෙන් සහ එය ඇතිවීමට බලපෑ හේතු කාරණා බොහෝමයක් සම්බන්ධව දීර්ඝ වශයෙන් කරුණු කාරණා ඉදිරිපත් කළ බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 08.8 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා</u>

වර්ථමාන රටේ පවතින තත්වය සම්බන්ධයෙන් සභාවේ බහුතරයක් මන්ත්‍රීවරුන් කරුණු කාරණා බොහෝ ලෙස ප්‍රකාශ කර සිටි අතර චාමර නානායක්කාර ගරු මන්ත්‍රී තුමන් විසින් රටේ තත්වය හොඳින් තේරුම් ගත් රටේ භූමිය තුළ පය ගසා ජීවත් වන අයෙකු ලෙස කාලීන වශයෙන් ඉතාමත් වැදගත් සාකච්ඡාවක් සිදු කිරීම සම්බන්ධයෙන් පෞද්ගලිකව ස්තූතිය පුද කර සිටින බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම පොහොර සම්බන්දව සැම සභා වාරයකදීම කතා බහ කරන අතර අද වන විට රටේ බහුතරයක් දෙනා ආහාරයට ගනු ලබන රට හාල් යනු මාස ගණනක් ප්‍රවාහන කටයුතු වලම යෙදෙන කොපමණ කාලයක් පැරණි වුවද ගුල්ලෙකු වත් හානි නොකරන තරමට රසායනික ද්‍රව්‍ය වලින් සමන්විත හාලක් වන අතර කොම්පෝස්ට් පොහොර භාවිතයට හුරු කරවීම බොරු ක්‍රියාවලියකට සූදානම්වීම කිසිම තේරුමක් නැති කටයුත්තක් බව ගරු මන්ත්‍රී තුමා සඳහන් කර සිටින ලදි. ඒ වගේම රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව සමයේදී එතුමන් බුද්ධිමත්ව තීන්දු තීරණ ගත් අතර එතුමන් විසින් රජයේ කිසිදු ආයතනයකට අවුරුදු දෙකක් යන තුරු සියලු බඳවාගැනීම් තහනම් කරමින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට පියවර ගත් අතර රටේ ජනතාව එය පිළිගැනීමට අකමැති වූ බැවින් අද

වන විට ලංකාවේ රාජ්‍ය සේවකයින් ඉතා සීඝ්‍ර අන්දමින් වැඩි වීමකට ලක්වී ඇති අතර ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන්ගේ පැමිණීමෙන් අනතුරුව කිසිම තේරුමක් නැති රැකියා ලක්ෂයක් දීමට කටයුතු කළ අතර මේ හේතුවෙන් සමහර ආයතන වල පියන්ගෙ වැඩ වලටත් සහය වීමට තවත් සහායකයෙක් සිටින අතර මේ වන විට සෑම ග්‍රාම නිලධාරී වසමකට රාජ්‍ය නිලධාරීන් වැඩි පිරිසක් සේවය කරන නමුත් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමට ගොවියෙකුට උපදෙසක් ලබා දීමට හෝ ඒ සම්බන්ධයෙන් මග පෙන්වීමක් කිරීමට කිසිම නිලධාරියෙකු නොමැති අතර, මේ පාලකයින් බුද්ධිමත්ව රට පාලනය කරනවා නම් මෙතරම් රට ආගාධයට පත් නොවන බව ගරු මන්ත්‍රීතුමන් සඳහන් කර සිටි අතර රටේ තත්ත්වය හේතුවෙන් ඉතාමත් දුකට වේදනාවට පත්ව සිටින ජනතාව තම දුක ප්‍රකාශ කිරීමට කෑ කෝ ගසමින් පෝලිම් වලට වී සිටීමට සිදුව ඇති අතර ඔවුන් මේ ආකාරයෙන් හැසිරෙන්නේ මත්ද්‍රව්‍ය භාවිතා කර නොවන අතර ඔවුන්ට දැනෙන දැවෙන ප්‍රශ්න ඇති අතර දරුවන් බඩගින්නේ අඬනවා කිරිපිටි, හාල් ,සීනි, පරිප්පු ආදී අත්‍යවශ්‍ය බඩුමල්ලක් ගෙදරට ගෙන යෑමට පහුගිය කාලයේ මනුස්සයෙකුට රුපියල් 3500 ක ට පමණ වියදම් කිරීමට සිදු වුවත් අද වන විට එම බඩු මල්ලම ගෙන යාමට රුපියල් දාහතර දහසක් පමණ මුදලක් ගෙවීමට සිදුව තිබීම කණගාටුදායක තත්ත්වයක් වන අතර ගෑස්, තෙල් අත්‍යවශ්‍ය ඖෂධ නොමැතිව ජනතාව මෙසේ කුපිත වීම ඉතාමත් සාධාරණ වන අතර කොරෝනා රෝගයෙන් මැරෙන සංඛ්‍යාව අඩු කර ගැනීමට රජය විසින් කටයුතු කළ නමුත් මෙම රෝගය මුළු ලෝකයේම පැතිර ගිය රෝගයක් වශයෙන් රෝගීන් මිය යාම දරුණු ලෙස බලපාන ලද ඉන්දියාව වැනි රටක වුවද ආර්ථිකය කඩාවැටීමට පාලකයින් ඉඩ නොදුන් අතර මෙම රටේ පාලකයින්ගේ ආර්ථික ප්‍රතිපත්තියක් , නිසි කළමනාකාරිත්වයක්, නිසි පාලනයක් නොමැති ව කටයුතු කළ නිසා මෙසේ රට කඩා වැටී ඇති බවත් ජනතාව මේ තරම් ආණ්ඩුවට ගෙදර යාමට බල කර තිබියදී මේ මොහොතේ ඔවුන්ගේ වගකීම විය යුත්තේ බලයෙන් ඉවත් වී සුදුස්සන්ට බලය පවරා දීම වන බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම වර්තමාන තත්ත්වයත් සමග ව්‍යාපාරිකයින් ඉතාමත් අන්ත අසරණ තත්ත්වයකට පත්ව සිටින අතර එය අවබෝධයකින් තොරව නොදකින බොහෝ පිරිසක් විසින් ව්‍යාපාරිකයින් කාක්කන් ලෙස කටයුතු කරනවා කියා හංවඩු ගැසීම සාධාරණ නොවන බව මන්ත්‍රීතුමා සඳහන් කර සිටි අතර අසාධාරණයන්ට එරෙහිව මිනිසුන් අරගල කිරීම රජ කාලයේ පටන් තිබූ දෙයක් බැවින් මේවාට ගරුකරමින් විසඳුම් ලබාදීම පාලකයින්ගේ වගකීම හා යුතුකම වන අතර එසේ නොහැකි නම් පසු බැස යා යුතු බවත් වර්තමානයේ රටේ පාලකයින් නිවැරදිව බුද්ධිමත්ව වගකීමෙන් යුතුව සත්‍ය ලෙස කටයුතු නොකිරීම හේතුවෙන් රටේ ජනතාවට වන්දි ගෙවීමට සිදුව ඇති අතර ජනතාව විසින් පිට කරනු ලබන මෙම ආවේගයන් අපට නතර කිරීමට නොහැකි අතර මේවට විසඳුම් ලබා දුන්නේ නැතිනම් මෙම තත්ත්වය තව තවත් බරපතළ වන අතර පාලකයින්ගේ වංචා කිරීම්, කෝටි ගණන් මුදල් හම්බ කර ගැනීම් නිසා මේ රට විනාශ වී ඇති බැවින් දැන්වත් මෙම වැරදි ක්‍රියා දාමයන් නවතා මේවාට නිසි විසඳුම් ලබාදීමට බුද්ධිමත්ව කටයුතු කල යුතු කාලය එළඹ ඇති බැවින් ඒ සඳහා වගකීමෙන් යුතුව කටයුතු කරන්න කියා ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තූතිය පුදකර සිටින ලදී.

## <u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් සිටි කාලයේ දී නොරොච්චෝලේ විදුලි බලාගාරය ඇති කළායින් පසුව පැමිණි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් කිසිම බලාගාර ක්‍රියාවලියක් සිදු නොකළ අතර ඒ ආණ්ඩු සමයේ ම සරුසාරව තිබූ සියලු වැව් සිදී යනතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් අතර අද වන විට විදුලි ප්‍රශ්නයට මූලිකම හේතුව මෙය බවත් දීර්ඝකාලීන සැලැස්මක් නොමැතිව පසුගිය ආණ්ඩුව කටයුතු කළ අතර අවුරුදු දෙසීයකට වරාය පිටරටවලට විකුණූ බවත්, මහින්ද රාජපක්ෂ මහතා විසින් සැලසුම්සහගතව කරගෙන ගිය උමා ඔය ව්‍යාපෘතියේ ජලය ටික ප්‍රයෝජනයට ගත නොහැකි වූ අතර ඉන්දියාවට සිග්නල් ලබාදීම සඳහා ආරම්භ කරන ලද නෙළුම් කුළුනෙහි උස

පහුගිය ආණ්ඩු සමයේ අඩු කර සකස් කිරීම මත මෙරටට ලැබීමට නියමිතව තිබූ විශාල මුදලක් අහිමි වී ගිය බවත්, මහ දවාලේ සිදු කළ මහ බැංකු කොල්ලකෑම ඒ ආකාරයෙන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් රටට සිදුකළ හානියේ ප්‍රතිවිපාක වර්තමානයේ රට තුළ නිර්මාණය වී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

## 08.9 <u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - ප්‍රදීප් විජේරත්න මැතිතුමා</u>

දේශපාලනික, ආර්ථික, සාමාජීය වශයෙන් බරපතළ අර්බුදයකට රට මුහුණ දෙමින් පවතින මොහොතක් වශයෙන් මුල අමතක කිරීම, ඇහුම්කම් නොදීම සහ උද්දච්ච කම යන කාරණාවන් සහ නිසි වේලාවේදී ගත යුතු තීන්දු තීරණ නිසි වෙලාවට නොගෙන සිටීම යන කාරණා වර්තමාන රටේ අර්බුදයට බෙහෙවින්ම බලපාන ලද කාරණා වශයෙන් ගරු උප සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි. විශේෂයෙන්ම යහපාලන ආණ්ඩුවෙන් කළ වැරදි ක්‍රියාමාර්ගයන් සුලභව වර්තමාන තත්ත්වයට බලපා ඇති අතර ඒ වගේම රට තුළ උද්ගතවී ඇති මෙම බරපතළ ගැටළු සහගත තත්ත්වය සමබන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන් සහ ආණ්ඩුව සම්බන්ධයෙන් පෞද්ගලිකව විශාල කණගාටුවක් දුකක් පවතින බව ගරු උප සභාපතිතුමන් සඳහන් කර සිටින ලදි.

තුනෙන් දෙකේ බලය ලබාගෙන රට භාර ගනු ලැබුවේ මේ ආකාරයෙන් රට පුපුරා යයි කියන බලාපොරොත්තුවෙන් නොවන අතර ,නමුත් 2015 රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආණ්ඩු පක්ෂයේ සිටි මැති ඇමතිවරුන් හතළිස් හත් දෙනෙකුත් සමඟ ආණ්ඩුව පුරාවටම කටයුතු කරගෙන ගිය අතර ඒ අනුව බලද්දී වර්තමාන ආණ්ඩු පක්ෂයේ එකසිය විස්සකට ආසන්න මැති ඇමති මණ්ඩලයක් සමඟ කිසිදු විසඳුමකට නොයන්නේ මන්ද යන්න තමන්ට ගැටලුවක් බවත් නමුත් මේ මොහොතේ විපක්ෂයට ආණ්ඩුව භාර ගෙන මේ අර්බුදය විසඳීමට කටයුතු කරන්න අවස්ථාව දුන්නත් පවතින තත්ත්වයත් සමඟ ඔවුන් රට භාර ගැනීමට ඉදිරිපත් නොවීම සාධාරණ කාරණාවක් වන අතර අතිගරු ජනාධිපතිතුමන්ට පවතින විධායක බලතලත් සමඟ විශ්වාසය කඩාගෙන ඇති මැති ඇමැතිවරුන් ඉවත්කර විශ්වාසවන්ත බුද්ධිමත් අයවලුන් සමග එකතු වී ජනතාව තවත් පෝලිම් වල නොතියා ඔවුන් ඉදිරියට පැමිණ සිදුවූ වැරැද්ද පිළි ගෙන මේවට විසඳුම් ලබාදීමට හැකි බව ප්‍රකාශ කරමින් යම් කිසි සහන කාලයක් ජනතාවගෙන්ම ඉල්ලා ගෙන නව කැබිනට්ටුවක් සමග මේ ප්‍රශ්න විසඳා ගැනීමට ජනතාවට පැහැදිලි කිරීමක් කරනවා නම් බුද්ධිමත් ජනතාව එයට ඇහුම්කම් දෙන අතර මේ ආකාරයෙන් කටයුතු කරනවා නම් ජනතාවගේ විශ්වාසය නැවත දිනා ගැනීමට හැකි වන අතර මේ හැර වෙනත් විසඳුමක් මේ සඳහා නොමැති බව ගරු උප සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

ඒ වගේම කැබිනට් මණ්ඩලය වෙනස් කිරීමට අතිගරු ජනාධිපතිතුමන් කාලීන වශයෙන් ගත් ක්‍රියාව ඉතාමත් වටිනා තීරණයක් බැවින් සමාජ මාධ්‍ය ජාලා වලින් එකතු වන යම් යම් කණ්ඩායම් පාරට බැස මෙසේ අරගල කරද්දී සත්‍ය වශයෙන්ම මේ දැවෙන ප්‍රශ්න වලින් පීඩිතව සිටින බහුතරයක් ජනතාව තවමත් නිහඬව සිටින අතර රස්සාවට යන එන නිසාත් කුලී වැඩක් කර හෝ එදා වේල සොයා ගැනීමට අවශ්‍ය බැවින් වේලාව වෙන් කර ගත නොහැකි බැවින් ඔවුන් නිහඬව සිටියත් ඉදිරි දිනවලදී මේවාට විසඳුම් නොලැබුණහොත් රටේ සියලු ජනතාව පාරට බැසීමෙන් අනතුරුව මෙම තත්ත්වය බරපතළ තත්ත්වයක් බවට පත්වීමට ඉඩ ඇති බැවින් අතිගරු ජනාධිපතිතුමන් විසින් මේ තෝරාගත් සුදුසු බුද්ධිමතුන් සියලු දෙනා සමග ඉතා කඩිනමින් මේ ප්‍රශ්නවලට විසඳුම් සොයා ගත යුතු වන අතර මේ සඳහා සියලු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රකාශ කරමින් ගරු උප සභාපතිතුමන් සියළු දෙනාටම ස්තුතිය පුදකර සිටින ලදී.

## ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම

ගරු උපසභාපතිතුමන් ද වර්තමාන රටේ ඇති ඇති වී තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් සහ එම තත්ත්වයන්ට විසඳුම් සොයා ගත හැකි ආකාරය සම්බන්ධව දීර්ඝ පැහැදිලි කිරීමක් සිදු කළ අතර ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපගේ බලතල ප්‍රකාරව මේ සඳහා අවශ්‍ය උපරිම සහයෝගය ලබා දෙමු බවට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

- අනතුරුව සභිකවරුන්ගේ වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින්, ලබන මස සභා රැස්වීම 2022 වර්ෂයේ මැයි මස 13 වන සිකුරාදා දින ප.ව.2.30 ට යොදා ගැනීම සුදුසු බවට සභාවේ සියළු දෙනාගේම එකඟතාවය මත තීරණය කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි ගරු උප සභාපතිතුමන් ඇතුළුව සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.20 ට පමණ අවසන් කරන ලදී.

- 2022.04.08 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

සභා වාර්තාව ........................................................................ වන දින පැවැති මහ සභාවේ...............................................................................................යෝජනාවෙන් සහ...............................................................................................ස්ථිරත්වයෙන්

ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

| | | | |
|---|---|---|---|
| ල් හා ප්‍රතිපත්ති කසීම් කමිටුව | තාක්ෂණික සේවා කමිටුව | නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව | පරිසර හා පහසුකම් කමිටුව |

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ.........................................................................................................යෝජනාවෙන් සහ.............................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

1) මොනරාගල, මාගන්දනමුල්ල හි පිහිටි පරාක්‍රම මාවත ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන ඉතා අබලන්ව පැවති මාර්ගය ඊයේ දින ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ගමන් කිරිමටවත් නොහැකි ලෙස දැඩි සෝදා පාළුවකට පත්ව ඇති බැවින් එම මාර්ගය කුට්ටි ගල් අතුරා ඉතා කඩිනමින් පිළිසකර කර දීම අත්‍යාවශ්‍ය බැවින්, ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවුල් 07 ක පමණ ජීවත් වන ජනතාවක් මෙම මාර්ගය භාවිත කරන බැවින් කාර්මික නිලධාරි නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා කුට්ටි ගල් අතුරා භාවිතා කළ හැකි පරිදි ඉතා කඩිනමින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

2) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිම සඳහා යන වියදම සලකා බලා දැනට කිලෝ ග්‍රෑම් 01 ක විකුණුම් මිල වන රු.15.00, රු.20.00 දක්වා ඉහළ නැංවීමටත්, තව ද එක් ගොවියෙකු සඳහා නිකුත් කළ හැකි උපරිම කිලෝ ප්‍රමාණය තීරණය කිරිම සඳහාත් ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හිමිකරුවන්ගේ ඉල්ලීම් පරිදි ඔවුන් එම ඉඩම් සඳහා අදාළ අක්කර බදු ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ගෙවන්නේ නම් එම කුඹුරු ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවේ ලේඛනවල සටහන් කර ඇති වරිපනම් බදු පිළිබඳ තොරතුරු සහ අදාළ බිල් කිරීම් නතර කිරීමටත්, එම දේපල සඳහා මෙතෙක් පවතින රු.407,841.68 ක අය කර ගැනීමට නොහැකි හිඟ මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ලේඛනවලින් කපා ඉවත් කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

➢ **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**අවසන් පිටුවට**

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.30 ට පමණ අවසන් කරන ලදී.

- 2021.08.24 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,

- **හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර තීරණ ගත යුතු හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවට ගරු සභාපතිතුමා මහ සභාව වෙත ප්‍රකාශ කර ඒ සඳහා සභාවේ එකඟතාවය විමසා සිටින ලදි.

තවද න්‍යාය පත්‍රය සකස් කිරිමෙන් අනතුරුව අප වෙත ලැබුණු දැනුම් දීමකට අනුව මෙම ව්‍යාපෘතියට අදාල සංවර්ධන කටයුතු 2021 නොවැම්බර් මස 30 වන විට අවසන් කර බිල් පත් ඉදිරිපත් කළ යුතු බව දන්වා ඇති බැවින් මෙය හදිසි යෝජනාවක් ලෙස සභා අනුමැතියට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා මහ සභාවේ සියලු දෙනාගේ එකඟතාවය ලබා දීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පහත යෝජනව ද මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

I. තවද මාර්ග අමාත්‍යාංශය මගින් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මිලියන 52ක් වෙන් කර ඇති අතර එම ප්‍රතිපාදන මගින් මාර්ග 49ක් සංවර්ධනය කළ යුතුව ඇත.මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මෙන්ම මඩුල්ල, සියඹලාණ්ඩුව, බුත්තල යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ද මෙම සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය කිරිමේදි රෙඩි මික්ස් කොන්ක්‍රීට් යෙදිය යුතු බවට දන්වා ඇති අතර මෙම බල ප්‍රදේශ 4ටම රෙඩි මික්ස් සපයන ආයතන ඇත්තේ දෙකක් පමණක් බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර මෙම ආයතන දෙක මගින් මෙම මාර්ග සියල්ලටම රෙඩි මික්ස් සැපයීය යුතු අතර 2021 නොවැම්බර් මසට 30 දිනට පෙර අදාල මාර්ග වල ඉදිකිරීම් අවසන් කර මාර්ග අමාත්‍යාංශය වෙත බිල් පත් ඉදිරිලත් කළ යුතුව ඇත. එබැවින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට අයත් සංවර්ධනය කෙරෙන මාර්ග වැඩි ප්‍රමාණයක් පටු බව සහ බෑවුම් සහිත වීම නිසා රෙඩිමික්ස් ප්‍රවාහනයට අපහසු තත්ත්වයක් පවතින අතර කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍රය යොදවාගෙන මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මාර්ග අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇති පරිදි අදාල උපදේ හා කොන්දේසි වලට යටත්ව විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම ව්‍යාපෘතිවල කටයුතු අදාල දිනට පෙර සිදු කිරීම සුදුසු බවටත්, කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍ර යොදවාගනිමින් මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට පියවර ගැනීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.